## 1.1 හැඳින්වීම

පුරාණයේදී ඇදහිලි විශ්වාස මුලික කරගනිමින් පුජාවන්තය වෙනුවෙන් නර්තනය බිහිවන්නට ඇත. ශරීරයේ අංග, ප්‍රත්‍යංග , උපාංග උපයෝගී කරගනිමින් චලනයන් මඟ හැටුම හෙවත් නර්තනය නිර්මාණය විය. සරල චලනයන් තුළින් කිසියම් සන්නිවේදනයක් ලබාදීම මෙහි මුලාරම්භයයි. ක්‍රම ක්‍රමයෙන් ජන ජීවිතය හා සබැඳිව වර්ධනය වන විට අප සංස්කෘතිය තුළ ජනප්‍රියත්වයට පත්ව ඇති කලාවකි. අතීතයේදී නර්තන කලාවට පිවිසියේ මව්පිය උරුමයෙන් හා පාරම්පරිකව පමණි. එහෙත් වර්ධනය වන විට නිදහස් අධ්‍යාපනයේ ආනුභාවය නිසාවෙන්ම ආර්ථිකමය පහසුකම් මඟ ස්වකීය රුචි අරුචිකම් අනුව ඕනෑම කලාවක් හැදෑරීමේ වරප්‍රසාදය සියලු දෙනාටම හිමිවිය. හදාරනවුන්ගේ පහසුව පිණිස ඒවා උඩරට , පහතරට, සබරගමු , නැගෙනහිර, බැලේ , භරත , මනිපුරි ආදී වශයෙන් පවා වෙන් වෙන්ව පවතී. කෙසේ වුවද මේ මොහොත වන විට අපේ සාම්ප්‍රදායික නර්තන කලාව බොහෝ දුරට පරිහානියට පත්ව ඇති අයුරක් දක්නට ලැබේ. ඇස ගැටෙන සෑම ජවනයකම දක්නට ඇත්තේ අනිදියානු සම්ප්‍රදායට හෝ හින්දි ගීතයකට අනුව, ඉංග්‍රීසි ගීතයකට අනුව ශරීරයට වධ දෙන විකාර රූපී වූ නර්තන විලාසයකි.

ගෝලීයකරණය නම් විශ්ව සංකල්පයත් සමඟම ජනප්‍රිය සංස්කෘතිය අප රටේ ද මුල්බැස ගන්නට විය. ඒත් සමඟම කලාවන්ද ජනප්‍රිය සංස්කෘතිය තුළට පැමිණි ප්‍රවිශ්ට අංගයකි. බොහෝ ජනයා කලාවේ පවතින්නා වූ සෞන්දර්යාත්මක රසවින්දනය නිසාවෙන්ම ඒ වෙත යොමුවේ. එහිදී සුළු වේලාවකට හෝ ඒකාකාරී ජීවන රටාවෙන් මිදී සම රසාලිප්ත හැඟීම් තුළ ගත කිරීමට හැකිවන නිසාවෙනි.නර්තනය කෙතරම් මිනිසුන් අතර පවතින්නේද යත් මෙම කලාව නොමැත්තේ කොතැනද? සෑම ක්ෂේත්‍රයක් තුළම රසවින්දනය වෙනුවෙන් හා මිනිසුන් රඳවා ගැනීමේ එක් උපක්‍රමයක් වශයෙන් නර්තනය යොදා ගෙන ඇත. එසේ සමාජයේ පවත්නා නර්තනය අනාගතයට රැගෙන යාමේ එක් මාධ්‍යයක් වශයෙන් ඡායාරූප ශිල්පය හඳුන්වා දිය හැකිය.

අතීතයේ ගෝත්‍රික ජනයා විසින් ගුහා චිත්‍ර සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ඡායාරූප යොදා ගෙන ඇත. අද දවසේ දෘශ්‍ය සන්නිවේදනයේදී යොදා ගන්නා වැදගත් මූලාශ්‍රයක් වන්නේ ඡායාරූපයයි.

"ආයාසයකින් තොරව මානවයාට මෙන්ම සත්ත්වයාටද පොදුවූ සාක්ෂරතාවය දෘශ්‍ය සාක්ෂරතාවය වෙයි. දැකීම හා පෙනීම යන චර්යා ධර්මතා දෘශ්‍ය සාක්ෂරතාවයට අත්තිවාරම වේ. සමාජය පරිසරය හා සන්නිවේදනය යන ත්‍රිවිධාංග සංකලනයෙන් දෘශ්‍ය සාක්ෂරතාවය බිහිවේ."[1] සාර්ථක ඡායාරූපයක් නම් එහි නිර්මාණාත්මක බවක් පෙන්නුම් කළ යුතුය. ප්‍රේක්ෂකයෙකුට මොහොතක් ඒදෙස බලා සිටීමට හැකිවන්නේ නම් එය සාර්ථක ඡායාරූපයයි.

"සැබෑ වස්තූන් ඒ හැටියට රූපගත කිරීම හුදු වාර්තාකරණයක් පමණක් වේ. ඡායාරූප තුළින් අපූර්වත්වයක් ඇති කිරීමෙන් නිර්මාණශීලී දෘශ්‍ය සන්නිවේදනයක් ඇති කළ හැකිවේ. ඡායාරූප ශිල්පියාගේ මූලික මෙවලමක් වශයෙන් කැමරාවක් භාවිතයට ගත්තද ඒ භාණ්ඩය පිටුපස මිනිස් ඇසක් ඇත. ඒ හේතුවෙන් කැමරාවකින් බිහිවන්නේ අපූර්ව නිර්මාණයක් නම් එය සිත්තරෙකුගේ කාර්යයට සමානවූ හෝ එය ඉක්මවූ හෝ දෘශ්‍ය නිර්මාණයක් විය යුතුය."[2]

නූතන කාලීන සමාජයේ නර්තන ඡායාරූපයන් බොහෝ සෙයින් දක්නට ලැබේ. නමුත් මේ කලාව තුළ ඇලු පිරූ පුද්ගලයන් වන්නේ නම් එය අතලොස්සකි. එයට හේතුවක් වශයෙන් දැක්විය හැක්කේ නර්තනය තුළ ඇත්තේ සංකීර්ණ චලනයන්ය. එනිසාවෙන් නිර්මාණාත්මක අවස්ථාවක් තම කැමරා කාචයට හසුකර ගැනීම අභියෝගයක් වන නිසාවෙනි. මෙම ක්ෂේත්‍රය හා සම්බන්ධව වෘත්තීමය ඡායාරූප ශිල්පීන් ද ලංකාව තුළ දක්නට නොමැත. ඒ හා සම්බන්ධව අතලොස්සක් පමණක් ක්‍රියාත්මක වන්නේද ඔවුන්ගේ ආශාව හා උනන්දුව නිසාවෙනි. එසේම නර්තන ඡායාරූපකරණයේ නියැලෙන්නෙකු නම් එහි අන්තර්ගතය පිළිබඳ අවබෝධයක් ඇත්තේ නම් තම කාර්යයන් සාර්ථක කර ගැනීමට හැකිවේ.

1. සෙව්වන්දි ලලිතා, කාව්‍ය පෝස්ටරයක් පිළිබඳ අධ්‍යයනයක්, මාධ්‍ය පර්යේෂණ, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ 10 , 2004, 150 පිටුව.
2. මහේන්ද්‍ර සුනන්ද, නිර්මාණාත්මක සන්නිවේදනය, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10,1999,94 පිටුව.

මේ වන විට ශ්‍රී ලාංකේය නර්තන ශාස්ත්‍රීය ශිල්පයේ නියැලී සිටින්නන් ලෙස තිනාල් ප්‍රනාන්දු , පී.යූ.ඩී. පෙරේරා , හෙන්රි රාජකරුණා සහ උදේනි අල්විස් , දී.ග. සෝමපාල යනාදී පුද්ගලයන් ඉදිරියෙන් සිටී. සිංහල නර්තන සම්ප්‍රදායේ අතීත උරුමය වර්තමානයට දායාද කළා වූ සුවිශේෂී ශාස්ත්‍රීය ශිල්පියෙකු ලෙස තිනාල් ප්‍රනාන්දු මහතා ඔහුගේ කාර්යය මැනවින් ඉටුකර ඇත. වර්තමානයේදී ප්‍රවීන නර්තන ශිල්පීන්ද බොහෝ තමන්ගේ මග සකසා ගැනීම සඳහා ශාස්ත්‍රීයත්වය ඉවහල් කරගෙන ඇත.

නර්තනය තුළ තවත් අනුශාංගික කලාවන් රැසක් දැකගන්නට හැකිවේ. එබැවින් ඒ සම්බන්ධව ද ශාස්ත්‍රීය ශිල්පීන්ට අවබෝධයක් තිබීම බොහෝවිට වැදගත්ය. නර්තන අංගයක් තුළ පුද්ගලයන් සමූහයකගේම හැකියාවන් දක්ෂතාවයන් ශාස්ත්‍රීයභාවයෙන් පිළිබිඹු විය යුතුය. එවිට එම කාර්යය හා සම්බන්ධ වූ සියලු දෙනාටම එහි ශාස්ත්‍රීය සර්ව සාධාරණ වන්නේය.

වර්තමානයේදී සාම්ප්‍රදායික නර්තනය වෙනුවට ජනප්‍රිය සංස්කෘතියත් සමඟ නව නිර්මාණ කලාවන් බිහිවන්නට ඇත. එම නිර්මාණකරණය තුළ බොහොමයක් දෙනාගේ අභිප්‍රාය වී ඇත්තේ අන් කිසිවක් නොව වාණිජත්වයයි. මේවායෙහි දක්නට ලැබෙන්නේ අන්තර්ගතය හිස් දමා අලංකාර ලෙස ආකෘතීන් සරසා තිබීමයි. මෙය කාලීන පුද්ගල රසාස්වාදයේ අවශ්‍යතාවයන් ඉටුකරනු වස් අලුතින්ම නිමැවුණු අංගයකි. මේ හේතුවෙන් අද වන විට සිදුවන්නේ බෙර පදයට අනුව නැටීමක් නොව ගීතයක ආත්මයට අනුගත වන නර්තනයක් ඉදිරිපත් කිරීමය. එයද බොහෝ විට නිර්මාණය වනුයේ අපේ සාම්ප්‍රදායික නර්තන කලාවන් අනුසාරයෙනි.

එදා පූජනීයත්වයෙන් සැලකූ නර්තනය මෙතෙක් නිවැරදිව හඳුනා ගැනීමට හා එහි පැවැත්ම සනිටුහන් කිරීමේ මාධ්‍ය වන්නේ ශාස්ත්‍රීයභාවයයි. එදා විධිමත්කරණය නොපැවතුණ නිසාවෙන්ම දිගු කාලීනව පැවතගෙන එන්නේ ශාස්ත්‍රීයභාවයයි. එහි සිංහල නර්තන කලාවේ දේශීයත්වය, අනන්‍යතාවය ඒ අයුරින්ම පැවතියද වර්තමානය වන විට එසේ පැවතියාවූ අනන්‍යතාවය කෙමෙන් කෙමෙන් වියැකී යන අයුරු දක්නට වේ. බොහෝ දෙනා නර්තන විලාසයන් රස ගැනීම වෙනුවෙන් නොපසුබට උත්සාහයෙන් කටයුතු කරන අතරම ජනප්‍රිය සංස්කෘතියත් සමඟ නර්තනය අත්වැල් බැඳ ගැනීමේදී බොහෝ දෙනාට නර්තනයේ යථාර්ථය හා අප නර්තන සම්ප්‍රදාය නොහඳුනන පුද්ගලයන්ට එය අමතකව ගොස් ඇති බවක් දක්නට ඇත.